# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/48 - 2021 ඔක්තෝබර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඉඩම් සංවර්ධන ආඥාපනත**

1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි.

**එස්. එම්. චන්ද්‍රසේන,**
ඉඩම් අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2021 ඉඩම් සංවර්ධන රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ආඥාපනතේ 25 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක හා ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍රයක කොන්දේසිවලට ඇතුලත් කර ඇති අවම අනු බෙදුම් ඒකකය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

    I. ගොඩ ඉඩම් - එම ඉඩම් පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම අනු බෙදුම් ඒකකය

    II. වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් - අක්කර 1 යි

    III. වාණිජ භෝග සඳහා බැහැර කර ඇති ඉඩම් - අක්කර 1 යි


1A - PG 5585 - 370 (2021/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

IV. මධ්‍යම පාන්තික ඉඩම් - අක්කර 2 1/2 යි

V. අහස් දියෙන් වගා කරනු ලබන ගොඩ ඉඩම් - අක්කර 1 යි

3. මෙම සංශෝධිත අවම අනු බෙදුම් ඒකකයට අනුරූප වන ලෙස අවම භාගය නිර්ණය කළයුතු වේ.

4. දැනටමත් නිකුත් කර ඇති අවසර පත්‍රයක හෝ දීමනාපත්‍රයක අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වන අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් අවසර පත්‍රයේ හෝ දීමනාපත්‍රයේ පිටසනක් යෙදීම මඟින් එම සංශෝධනය කළ හැකි වේ. එම පිටසන 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

5. දීමනාපත්‍රයක් මඟින් බෙදාදී ඇති ඉඩම හෝ ඉන් කොටසක් නියමිත පූර්ව ලිඛිත අවසරයක් මත නොතාරිස් ඔප්පුවක් මඟින් බැහැරකර ඇති අවස්ථාවක එම නොතාරිස් ඔප්පුවේ අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වන අවස්ථාවකදී ඉහත 4 රෙගුලාසිය පරිදි ක්‍රියාකල යුතු වේ. එහිදී යොදාගනු ලබන පිටසන 'ආ' ආකෘතියට සාරානුකූල විය යුතුය.

'අ' ආකෘතිය

<u>ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසරපත්‍ර/ දීමනාපත්‍ර වල අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම</u>

.......................... දිස්ත්‍රික්කයේ .......................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි .......................... අංක දරණ පිඹුරේ/ සිතියමේ අංක .......................... දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් ................. වන ඉඩම් කොටස සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කර ඇති අංක ................. දරන අවසරපත්‍රයේ / දීමනාපත්‍රයේ අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් ................. ලෙසත් අවම භාගය ................. ලෙසත් සටහන් කර ඇත. එම අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට මාගේ අනුමැතිය ලබාදෙමි.

I. අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් .................

II. අවම භාගය ................. ක් වේ.

........................................ ........................................

ප්‍රාදේශීය ලේකම් අවසරපත්‍රකරු / දීමනාපත්‍රකරු

දිනය : ........................................ දිනය : ........................................

'ආ' ආකෘතිය

<u>ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද දීමනාපත්‍ර නොතාරිස් ඔප්පු මගින් බැහැර කර ඇති අවස්ථාවලදී අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීම</u>

.......................... දිස්ත්‍රික්කයේ .......................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි .......................... අංක දරණ පිඹුරේ/ සිතියමේ අංක .......................... දරණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් ................. වන ඉඩම් කොටස සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති අංක ................. දරන දීමනාපත්‍රයේ අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ....................... පර් ..................... ලෙසත් අවම භාගය .................... ලෙසත් සටහන් කර ඇත. එම දීමනාපත්‍රය මගින් පවරා දී ඇති සම්පූර්ණ ඉඩම/ ඉඩමෙන්

හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් ................. ක ප්‍රමාණයක් මාගේ අංක .......................... හා .......................... දිනැති ලිපිය මගින් ........................................................................................ ලිපිනයේ ..................................................... යන අය වෙත බැහැර කිරිම සඳහා අනුමැතිය ලබා දී ඇති බැවින් එම අනුමැතිය පදනම් කර ගනිමින් ප්‍රසිද්ධ නොතාරිස් ..................................................... විසින් ලියා සහතික කරන ලද අංක ......................................... දරන නොතාරිස් ඔප්පුව මගින් බැහැර කර ඇත. එම නොතාරිස් ඔප්පුවේ සඳහන් අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය පහත පරිදි සංශෝධනය කිරීමට මාගේ අනුමැතිය ලබාදෙමි.

I. අවම අනු බෙදුම් ඒකකය හෙක්ටයාර් ................. /අක් ................. රූඩ් ................. පර් .................

II. අවම භාගය ................. ක් වේ.

.........................................
ප්‍රාදේශීය ලේකම්
දිනය : .........................................

.........................................
පැවරුම්ලාභියා
දිනය : .........................................

11 - 221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.